**ශීර්ෂය 163 - අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 163 - අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 15 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,412.94 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,324.13 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3,088.81 ක් හෙවත් සියයට 69.99 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 889.20 | 820.48 | 68.72 | 7.73 |
| මූලධන | 3,523.74 | 503.65 | 3,020.09 | 85.71 |
| **එකතුව** | **4,412.94** | **1,324.13** | **3,088.81** | **69.99** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 16301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 34.00 | 29.88 | 16.00 | 25.13 | 100.00 | 81.70 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන අංක 6000/0000/00/0015/0054/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 25.17 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 16301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශනය හා පාලන ගිණුම අතර 2015 දෙසැම්බර් 31 දිනට ශේෂයේ රු. 1,702,288 ක වෙනසක් පැවැතුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය තුළ වැඩ තහනම් කළ නිලධාරින්ගෙන් රු.276,160 ක් ද, ඉල්ලා අස්වූ නිලධාරින්ගෙන් රු.98,130 ක්ද, සේවය හැරගිය නිලධාරින්ගෙන් රු.150,623 ක්ද, මියගිය නිලධාරින්ගෙන් රු.101,300 ක්ද හා ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් රු.50,300 ක්ද ඇතුළුව එකතුව රු.677,439 ක හිඟහිටි ණය ශේෂ වර්ෂ 4 කට වඩා වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

---------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

අමාත්‍යාංශයට අයත් පැරණි වාහන 10 ක් වර්ෂ 1 ½ ක ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම වාහන සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 14 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. වත්කම් නියමිත පරිදි අපහරණය නොකිරීම නිසා රජයට ලබාගත හැකි ආදායම අහිමි වී තිබුණු අතර එම වාහන දිරාපත්වීමට ඉඩ සලසා තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන 34 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2016 අගෝස්තු 26 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 757(2) හා 1647 (ආ) ප්‍රකාරව අමාත්‍යාංශය සතු සියලුම වාහන පිළිබඳ සමීක්ෂණයක් පවත්වා එම වාර්තා විගණකාධිපති වෙත 2016 අගෝස්තු 26 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

------------------------------

අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 215,574,452 ක් වූ අතර, ඒවා වර්ෂ 01 කට අඩු කාලයක සිට පැවැත එන බැරකම් විය. වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු.26,764 ක ඉතිරිය ඉක්මවා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.403,978 ක බැරකම්වලට එළඹ තිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම.**

2016 ජුනි 24 දින වන විට සංස්කෘතික මධ්‍යස්ථාන 185 ක් පැවැති අතර එයින් මධ්‍යස්ථාන 8 ක පමණක් ඉඩමේ අයිතිය අමාත්‍යාංශය සතුව පැවති අතර අනෙකුත් මධ්‍යස්ථාන 177 කම ඉඩමේ අයිතිය අමාත්‍යාංශය සතු වී නොතිබුණි.

## 3.4 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් රාජකාරිය සඳහා පැමිණීම හා පිටවීම සනාථ නොකර එකතුව රු.4,479,996 ක් වැටුප් හා දීමනා වශයෙන්ද එකතුව රු.823,990 ක අතිකාල හා ගමන් වියදම් දීමනාද ගෙවා තිබුණි.

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යවරයාගේ පුද්ගලික ලේකම්වරයා ලෙස 2015 ජනවාරි 16 දින සිට 2015 ජූලි 30 දින දක්වා කාලය තුළ එකතුව රු.284,360 ක් වැටුප් හා දීමනා ලෙස අමාත්‍යාංශයෙන් ලබා ගෙන තිබුණි. එම කාල පරිච්ඡේදයට අදාළව එම නිලධාරියා මධ්‍යම පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙසද කටයුතු කර දීමනා වශයෙන් රු.311, 902 ක් මධ්‍යම පළාත් සභාවෙන්ද ලබා ගෙන තිබුණි.

(ආ) අමාත්‍යවරයාගේ මහජන සම්බන්ධතා නිලධාරි ලෙස 2015 ජනවාරි 16 දින සිට 2015 ජූලි 30 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව අමාත්‍යාංශයෙන් එකතුව රු.411,090 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පාලනය වන සංස්කෘතික සංරක්ෂණ සමාගමේ අධ්‍යක්ෂ ලෙස එම නිලධාරිණිය සේවය කරමින් එම කාලයට අදාළව එකතුව රු. 300,000 ක් වැටුප් හා දීමනා ලෙස එම සමාගමෙන් ලබා ගෙන තිබුණි.

(ඇ) අමාත්‍යාංශය සතු නිල රථයක් වෙනුවෙන් මසකට වරක් වාහනයේ තිරිංග පද්ධතියේ අළුත්වැඩියාවයන් සිදු කර තිබුණි. ඒ සඳහා 2013 වර්ෂයේ සිට 2015 ජූලි 30 දින දක්වා මාසයට රු.51,204 ක් බැගින් මාස 20 ක් සඳහා රු.1,024,080 ක් ගෙවා තිබුණි. ඊට හේතු ලෙස සුඛෝපභෝගී වාහනයක් බැවින් එවැනි අළුත්වැඩියාවක් අවශ්‍ය බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විගණනයට දන්වා තිබුණි. නමුත් එම වාහනය මිලදී ගන්නා අවස්ථාවේදී ඉදිරිපත් කර තිබූ පිරිවිතරවලට අනුව තිරිංග පද්ධතියේ මෙවැනි අළුත්වැඩියාවක අවශ්‍යතාවක් සඳහන් කර නොතිබුණි.

(ඈ) 2015 ජුනි 07 දින සිට ජුනි 17 දින දක්වා චීනයේ පැවති "Management of The Museum as a Non-profit Organization" පාඨමාලාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහභාගි කරවා ගත යුතුව තිබුණත්, කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙන් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් නොවන නිලධාරින් දෙදෙනෙකු සහභාගි කර අමාත්‍යාංශය විසින් රු.114,400 ක් ගෙවා තිබුණි. එමෙන්ම 2015 ජුනි 26 දින සිට ජූලි 15 දින දක්වා චීනයේ පැවති "Seminar for Directors of Festival from Developing Countries" වැඩමුළුව සඳහා අධ්‍යක්ෂවරුන් වෙනුවට අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය මත සංවර්ධන සහකාරවරයෙකු සහභාගි වී තිබූ අතර ඒ සඳහා රු. 84,300 ක්ද වැය කර තිබුණි.

(ඊ) අමාත්‍යාංශයට කිසිදු සම්බන්ධයක් නොමැති බාහිර කලායතනයක නාට්‍ය කණ්ඩායමක් කල්කටාවේ ජාත්‍යන්තර නාට්‍ය උළෙලකට සහභාගිකරවීම වෙනුවෙන් ගුවන් ප්‍රවේශ පත්‍ර සඳහා රු.187,200 ක් අමාත්‍යාංශය විසින් වැයකර තිබූ අතර එම ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා එම ආයතනයන් විසින් කැඳවා තිබුණු මිල ගණන් මත එම ගෙවීම් කර තිබුණි.

(උ) 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.323,197 ක ගෙවීම් හා රු.23,836,940 ක බැඳීම් ඇතිකරගෙන ඉදිකිරීමට සැලසුම්කර තිබූ අනුරාධපුර ප්‍රාසාංගික කලා රඟහල සම්බන්ධයෙන් පහත ප්‍රධාන අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැති වීම.
(ii) ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබීම.
(iii) ඉඩමේ අයිතිය නිරවුල් කර නොගැනීම.

## 3.6 අවිධිමත් ගනුදෙනු

--------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) අනුරාධපුර ප්‍රාසාංගික කලා රඟහල ඉදිකිරිම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදන තීරණ අංක CA/PRO/2015/13 මඟින් 2015 මාර්තු 03 දින අනුමැතිය ලබා දී තිබුණි. එදිනට පෙර 2015 පෙබරවාරි 16 දින වන විටත් මැනුම් කටයුතු වෙනුවෙන් රු.300,000 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙතද, රු.23,197 ක් අනුරාධපුර දිස්ත්‍රික් මිනුම් අධිකාරිය වෙතද ගෙවා තිබුණි.

(ආ) The Seminar on Cultural and Globalization Asia සම්මන්ත්‍රණයට සහභාගී වීමට ආරාධනා කරන ලද ලිපිය අනුව අදාළ සංවිධායකයින් විසින් ගුවන් ගමන් ප්‍රවේශපත්‍ර වියදම, ආහාර, නවාතැන් සහ අභ්‍යන්තර ප්‍රවාහන පහසුකම් ලබාදෙන බව දන්වා තිබුණත්, ඒ සඳහා අමාත්‍යාංශය වෙතින් සංයුක්ත දීමනා හා යැපීම් දීමනා ලෙස 2012 වර්ෂයේදී ඇමරිකන් ඩොලර් 1530 ක් හෙවත් රු.195,000 ක් නිලධාරියෙකු වෙත ගෙවා තිබුණි.

## 3.7 අනාර්ථික ගනුදෙනු

-----------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) ශිල්පීන් විදේශගත වීමේදී එම විෂය පිළිබඳ නිපුනත්වයක්ඇති කළමනාකරුවන් හෝ සහකාර කළමනාකරුවන් සහභාගි විය යුතු වුවත්, එම විෂය පිළිබඳ නිපුනත්වයක් හෝ අවබෝධයක් නොතිබුණු නිලධාරීන්, කළමනාකරුවන් හෝ සහකාර කළමනාකරුවන් ලෙස නිරන්තරයෙන් සහභාගී වී තිබුණි. ඒ අකාරයෙන් සහභාගි වූ නිලධාරීන් 05 දෙනෙකු වෙත 2013 වර්ෂයේදී රු.616,780 ක්ද, නිලධාරින් 07 දෙනෙකු සඳහා 2014 වර්ෂයේදී රු. 1,246,330 ක්ද, නිලධාරින් 07 දෙනෙකු සඳහා 2015 ජුනි 30 දින වන විට රු.1,261,192 ක්ද වැය කර තිබුණි. විෂය දැනුම හා ශිල්පීය නිපුණතාවයෙන් යුත් නිලධාරින් එම කටයුතුවලට සහභාගි කරවීම කෙරෙහි අමාත්‍යාංශය හා සම්බන්ධිත ආයතන විසින් අවධානයක් යොමුකර නොතිබුණි.

(ආ) ආදිවාසි ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ වැඩසටහනට අදාළව ශ්‍රී ලංකාවේ ආදිවාසි පාරම්පරික වෙදකම හා වෙනත් සාම්ප්‍රදායික පුරුදු පිළිබඳ දැනුම අධ්‍යයනය හා ප්‍රවර්ධනය

සඳහා බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය සමඟ *අමාත්‍යාංශය* විසින් පහත සඳහන් අරමුණු සඳහා 2009 දෙසැම්බර් 16 දින සිට 2010 අගෝස්තු 31 දින දක්වා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සඳහා 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු. 3,247,000 ක් වියදම් කර තිබුණි.

(i) ආදිවාසි ජනතාව සතු වෛද්‍ය ක්‍රම, ආහාර රටාව හා පාරම්පරික දැනුම අධ්‍යයනය හා ප්‍රවර්ධනය.

(ii) ආදිවාසීන් ප්‍රයෝජනයට ගන්නා ඖෂධීය ශාක නිවැරදිව හඳුනාගැනීම, භාවිතය, සංරක්ෂණ වගා පිළිබඳ අධ්‍යනය හා ප්‍රවර්ධනය.

(iii) ආදිවාසී සංස්කෘතිය හා බැඳි සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රම / යන්ත්‍ර මන්ත්‍ර පිළිබඳ අධ්‍යයනය හා ප්‍රවර්ධනය.

(iv) ආදිවාසීන් විසින් භාවිතා කරනු ලබන වනජ ශාක තිරසාර භාවිතය හා මානව උද්භිත විද්‍යාත්මක කරුණු පිළිබඳ අවධානය.

(v) ආදිවාසී ගම්මාන සකස් කිරීම සඳහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ දායකත්වය.

(ඇ) 2012 නොවැම්බර් 06 දින ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ පාරම්පරික උරුමය පිළිබඳ පර්යේෂණ ග්‍රන්ථයේ අත්පිටපත අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණද, 2016 ජුනි 30 දින වන විටත් එම ග්‍රන්ථය මුද්‍රණය කර ප්‍රකාශයට පත්කර නොතිබුණි. ගිවිසුම්ගත කාලය අතරතුර නිසි අධීක්ෂණයක්ද ගිවිසුමේ සඳහන් අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු කාර්යයන්ද අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබු අතර මෙම වැඩසටහනෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුවී නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට පැවති සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 22 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 638 | 545 | 93 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 468 | 539 | - | 71 |
| | **එකතුව** | **1,134** | **1,110** | **95** | **71** |

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ පුරප්පාඩු 1 බැගින්ද ද්විතියික මට්ටමේ පුරප්පාඩු 93 ක්ද විය. ආදේශක පදනම මත මධ්‍යස්ථාන මුරකරුවන් 114 ක් බඳවා ගැනීම නිසා ප්‍රාථමික මට්ටමේ අතිරික්ත සේවක සංඛ්‍යාව 71 ක් විය.

(ආ) ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 6.1 වගන්තිය, මුදල් රෙගුලාසි 71(1) හා රෙගුලාසි 71(2) හි සඳහන් විධිවිධානයන්ට, පටහැනිව සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා ආදේශක පදනම මත මුරකරුවන් බඳවාගෙන 2014, 2015 හා 2016 ජූලි 30 දක්වා පිළිවෙලින් රු. 114,882,051 ක්, රු. 25,785,823 ක් සහ රු. 8,017,971 ක් ගෙවා තිබුණි.